**ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891 ප්‍රකාරව සේවක ඇප ලේඛනය පවත්වා නොතිබුණි. | සේවක ඇප ලබාගැනීම සම්බන්ධ කටයුතු ආරම්භ කර ඇති අතර 2023 වර්ෂයේ සිට මු.රෙ.891 අනුව සේවක ඇප ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 891 හි විධිවිධාන ප්‍රකාරව ඇප ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සඳහා රු.396,000,000 ක ශුද්ධ මුදල් ප්‍රතිපාදනයක් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.295,746,871 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පුනරාවර්තන වියදමෙන් 14% ක් හා මූලධන වියදමෙන් 69% ක් ඉතිරි වී තිබුණි. | බලාපොරොත්තු වූ පරිදි අවශ්‍යතා ඇති නොවීම, නිලධාරීන් ස්ථාන මාරුවීම හා වැටුප් රහිත නිවාඩු ලබාගැනීම, නිවසේ සිට රාජකාරි ඉටු කිරීම, රටේ පැවති වාතාවරණය මත විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හා චක්‍රලේඛ උපදෙස් මත වියදම් පාලනය කිරීම වැනි හේතූන් මත මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | ප්‍රතිපාදන ඉල්ලීම හා වියදම් කිරීම හැකිතාක් නිවැරදිව කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, තම දෙපාර්තමේන්තුවට අදාළ කෙටුම්පත් ඇස්තමේන්තු, මුදල් රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කරන බවට වගබලා ගැනීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ සමස්ත පුනරාවර්තන වැය විෂයයන් 15 කින් පුනරාවර්තන වැය විෂයයන් 04 කට සහ මූලධන වැය විෂයයන් 02 ක් වෙත සලසා තිබුණු රු.12,290,000 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සහ මූලධන වැය විෂයයන් 04 ක් වෙත මාරු කර තිබූ බැවින් මුදල් රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය. | • සේවකයන්ගේ ස්ථාන මාරු වීම, විශ්‍රාම යාම හා රා.ප.ච.14/2022/02 චක්‍රලේඛයට අනුව වැටුප් රහිත නිවාඩු ලබාගැනීම නිසා 1001 හා 1002 වැය විෂයන්ගේ ප්‍රතිපාදන ඉතිරි වී ඇත.<br>• රටේ පැවති ආර්ථික අස්ථායීතාවය හේතුවෙන් ලිපිද්‍රව්‍ය මිළ ගණන් ඉහළ යාම, දුරකථන ගාස්තු ඉහළ යාම, ප්‍රවාහන ගාස්තු ඉහළ යාම හේතුවෙන් ඒ සඳහා වෙන් කල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බව දක්වා ඇත. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව සකස් කළ යුතුය. |
| (ඇ) | එක් වැය විෂයයක සියයට 100 ක්ද, වැය විෂයයන් 27 ක් සියයට 32 සිට සියයට 95 ක පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | නිරීක්ෂණ පිළිගෙන ඉතිරිය සඳහා හේතු වෙන වෙනම ඉදිරිපත් කර ඇත. | ඇස්තමේන්තු නිවැරදිව කල යුතුය. |
| (ඈ) | වැය විෂයන් 09 ක ප්‍රතිපාදනයන් මු.රෙ. 66 මඟින් වෙනත් වැය විෂයන් වලට මාරු කිරීමෙන් පසුද සියයට 02 සිට සියයට 22 ක පරාසයක ඉතිරිවීම් තිබූ බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත පරිදි වවුචර් ඉදිරිපත් නොවීම හා ආනයනය සීමා කිරීම හේතුවෙන් අවශ්‍යතාවයට අනුව භාණ්ඩ සපයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපාදන මාරු කරගත් වැය විෂයන් වල ප්‍රතිපාදන සියයට 02 සිට සියයට 22 පරාසයකින් ඉතිරි වී ඇත. | ප්‍රතිපාදන ඉල්ලීම හා වියදම් කිරීම හැකිතාක් නිවැරදිව කල යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව මුදල් වර්ෂය සඳහා සලසා තිබූ ප්‍රතිපාදන සීමාව නොඉක්මවිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ වැය විෂයයක ප්‍රතිපාදන කර තිබූ මුදල ඉක්මවා, රු.816,709 ක් බැරකම් වලට එළඹ තිබුණි. | 2022 වර්ෂය මැද භාගයේ දී දුරකථන ගාස්තු ඉහළ යාම හා මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අනුව දුරකතන හා අන්තර්ජාල වියදම් පාලනය කිරීම අපහසු වීම හේතුවෙන් එම වර්ෂයට ඇස්තමේන්තු කල ප්‍රතිපාදනයට වඩා වැඩියෙන් වියදම් දැරීමට සිදු විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදය ප්‍රකාරව බැදීම් හා බැරකම් ප්‍රකාශය, භාණ්ඩාගාරය එක් එක් වියදම් ශීර්ෂවලට අදාළව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශන (SA 92) සමග සැසඳී තිබිය යුතුය. දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.13,457,528 වුවත්, භාණ්ඩාගාර වාර්තා අනුව එම ශේෂය රු.14,297,162 වූයෙන් රු.839,634 කින් සැසඳී නොතිබුණි. | වැය විෂයන් කිහිපයක පවතින ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් ඇතිකරගෙන ඇති නමුත් CIGAS වැඩසටහන තුළ බැඳීම් බැරකම් ඇතුළත් කිරීමේදී පවතින ප්‍රතිපාදනය ඉක්මවා බැඳීම් බැරකම් වාර්තා කල නොහැකි වීම ඉහත වෙනසට හේතු වේ. | පෙර වර්ෂවල ගිණුම්ගත බැඳීම් නිවැරදිව සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය** | - | 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කරමින් පවතින අතර එය අවසන් වූ වහාම කෙටුම්පත විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | **(i) මු.රෙ.571** | 7,488,596 | එකතුව රු.7,488,596 ක් වූ වර්ෂ 10 වඩා කල් ඉකුත් වූ තැන්පතු, රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට හෝ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් වූ විට කොන්ත්‍රාත්තු වලින් වූ අලාභ ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පත් වනුයේ නව මාධ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරීම් කොන්ත්‍රාත්තුවට අදාළ රඳවා ගැනීම් මුදල් වේ. අලාභ අය කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින බැවින් රඳවුම් මුදල් නිදහස් කර නොමැත. 2023 මාර්තු 29 වන දින ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී එකඟ වූ පරිදි මෙම තැන්පතු මුදල රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii) මු.රෙ.802 (1)** - | වාහන නිෂ්කාර්යව නොපවතින බවට ආයතන ප්‍රධානියා විසින් වග බලා ගැනීමට පියවර ගතයුතු වුවද 2021 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 වන විට දෙපාර්තමේන්තුව සතු වටිනාකම රු.18,400,000 ක් වූ වාහන 02 ක් මාස 06 සිට මාස 23 දක්වා කාලයක් තුළ නිශ්කාර්යව පැවතුණි. | එහි සදහන් වාහන අතරින් වාහන දෙකක් 2022 වසරේ ප්‍රතිපාදන අවසන් වීම නිසා අළුත්වැඩියා නොකරන ලද අතර එය 2023 වසරේ ප්‍රතිපාදන යටතේ අළුත්වැඩියා කිරීමට තීරණය කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(iii) මු. රෙ 880** | රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩුබාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, රජයේ නිලධාරින්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන් 33 කු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් 33 දෙනෙකු හඳුනාගෙන ඇති අතර ඔවුන්ගෙන් ඇප මුදල් ලබා ගැනීම 2023 වර්ෂයේ දී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) **2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05 / 2008 (1) ඡේදය** | සියලුම රාජ්‍ය ආයතන විසින් තම ආයතන සඳහා පුරවැසි සේවාලාභි ප්‍රඥප්තිය හඳුන්වා දිය යුතු බවට උපදෙස් දී ඇත. එමගින් රාජ්‍ය ආයතනයන් විසින් මහජනතාවට ලබාදෙන සේවාවන් කඩිනම්ව, කාර්යක්ෂමව, ගුණාත්මකව හා අඛණ්ඩව ඉටු කරන බවට වූ ලිඛිත බැඳීමක් වන අතර, විධිමත්ව සකස් කරනු ලබන එම ප්‍රඥප්තිය කාර්යාලීය පරිශ්‍රය තුළ මැනවින් දර්ශනය වන අයුරින් ප්‍රදර්ශනය කළ යුතු බවට ද දක්වා ඇත. තවද රජයේ ගිණුම් කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි කාර්යසාධනය පිළිබඳව සිදු කෙරෙන ඇඟයීම්වලදී මෙම අවශ්‍යතාවය අවධාරණය කර තිබුණ ද දෙපාර්තමේන්තුව විසින් උක්ත චක්‍රලේඛ විධිවිධානවලට අනුගත වී කටයුතු කර නොමැති බවට නිරීක්ෂණය විය. | පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස් කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය හැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.179,740 ක් වූ ණය ශේෂ අයකරගෙන නොතිබූ අතර එම ශේෂ වර්ෂ 05 ක් ඉක්මවා තිබුණි. | එම්.ආරියරත්න (ලිපිකරු) මහතාගේ හිඟ ණය ශේෂය රු.56,265.00 වේ. මෙම හිඟ ණය මුදල පියවන ලෙස 2023.01.05 දින ලිපියකින් දැනුම් දී ඇති අතර ඒ සඳහා මේ වන තෙක් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත.<br><br>ඩී.සී.එල්.ද සිල්වා මහතා රජයට අයවිය යුතු හිඟ ණය ශේෂය රු.127,752.00කි. එම හිඟ ණය පියවන ලෙස 2022 දෙසැම්බර් 28 දින ලිපියකින් දැනුම් දී ඇත. | ණය ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 51 ක් ඉටුකර ගැනීමට නොහැකි වී තිබූ අතර ක්‍රියාකාරකම් 13 ක කාර්යය සාධනය 50% ටත් අඩු භෞතික ප්‍රගතියක් විය. ක්‍රියාකාරකම් 11 ක ඇස්තමේන්තු ගත ඉලක්ක ඉක්මවා විශාල කාර්යසාධනයක් එනම් සියයට 149 ත් සියයට 1107 ත් අතර පරාසයක් දක්වා පෙන්නුම් කර තිබුණි. ඒ අනුව සැලසුම් සකස් කිරීම දුර්වල මට්ටමක පවතින බැව් නිරීක්ෂණය විය. | එහි ඇතැම් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පිළිබඳ දත්ත ඇතුළත් කිරීමේ දෝෂ පැවතීම, කලින් කලට ඇති වන අවශ්‍යතා මත වැඩි කාර්යසාධනයක් පෙන්නුම් කිරීම, ප්‍රතිපාදන නොමැතිවීම /ප්‍රමාණවත් නොමැති වීම හේතුවෙන් කාර්යසාධනයේ විෂමතා පෙන්නුම් කළ අතර අදාළ දෝෂ නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කල යුතුය. |

## 3.2 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 02/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සියලුම ගණන් දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර නියමිත ආකෘතියේ සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරි අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතු වුවත් නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදි වේ. ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම සඳහා සටහන් කර ගන්නා ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු අතර ඊළඟ වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළයුතුය. නමුත් දෙපාර්තමේන්තුව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම 2022 වර්ෂය සඳහා පමණක් සකස් කළ එකක් විය. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්ම 4.2.2(ඉ) ප්‍රකාරව මාස 06 කට වරක් යාවත්කාලීන කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදි වේ. ඉදිරියේදී වසර 03ක කාලයක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ගැනීමටත් අවම වශයෙන් මාස 6ට වරක් යාවත්කාලීන කිරීමටත් සටහන් කර ගන්නා ලදී. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වීමේ අවදානම හඳුනාගෙන ඒවා අවම කිරීමට ගතයුතු පියවරයන් වශයෙන් නිසි ක්‍රම සම්පාදන සැලැස්මක් සකස් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය පිලියම් හා තීරණ ක්‍රියාත්මක කිරීමට කැපවීමක් පත් කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | දැනට දෙපාර්තමේන්තුවේ තිරසර සංවර්ධන අරමුණු සකස් කර නොමැති අතර ඉදිරියේදී නිසි ක්‍රම සම්පාදන සැලැස්මක් සකස් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය පිලියම් හා තීරණ ක්‍රියාත්මක කිරීමට කැපවීමක් පත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතු වුවද දෙපාර්තමේන්තුව සඳහා 2023 මැයි 08 දින දක්වා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුරේ රාජකාරි ආවරණයට තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස කටයුතු කරන ටී.පී.හෙට්ටිආරච්චි නිලධාරී මහතා 2023 අප්‍රේල් 03 දින සිට පත් කර ඇත. රජයේ විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**6. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුලදී මානව සම්පත් සංවර්ධනය සඳහා කටයුතු කර නොතිබුණි. | දැනට මානව සම්පත් සැලසුමක් සකස් කර නොමැති අතර 2023 වසරේදී සකස් කිරීමට නියමිතය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08 ක්ද ද්විතීය මට්ටමේ පුරප්පාඩු 89 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 24 ක්ද වශයෙන් පුරප්පාඩු 121 ක් පැවතීම ඵලදායි සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා බලපා තිබුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා අභ්‍යන්තර බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. ද්විතීය මට්ටමේ හා තෘතීය මට්ටමේ නිලධාරීන්ගේ දෙපාර්තමේන්තුගත පුරප්පාඩු තනතුරු සඳහා කලින් කලට විවිධ ආයතන අහෝසිවීමත් සමඟ එම නිලධාරින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කරගෙන ඇති අතර අනුමත තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු ආරම්භ කර ඇති නමුත් රජය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛවලට අනුව බඳවාගැනීම් තාවකාලිකව නතර කර ඇත. ඒකාබද්ධ සේවයේ තනතුරු සඳහා පත් කිරීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් පත්කිරීම්, ස්ථාන මාරුවීම් මගින් සිදු කෙරේ. | නිවැරදිව වැඩ පැවරීම්, උසස්වීම් ක්‍රම අනුගමනය කිරීමෙන් ඵලදායී සේවාවක් පවත්වා ගත යුතුය. |